***ISBN 978-955-4563-72-8***

# පුරාතන සමාජයේ පැවැති ලෙඩ රෝග හා නිවාරණ ක්‍රම

**අනුරුද්ධිකා දිල්හානි**

**ඉතිහාසය, අධ්‍යයනය අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.**

**සංක්ෂේපය**

***ලොව පැවති පැරණි ශිෂ්ටාචාරවල නගර නිර්මාණයේදී පවිත්‍රතාවයට මුල් තැනක් දී තිබේ. ඊජිප්තුව, මෙසපොතේමියාව ඉන්දු නිම්න ශිෂ්ටාචාර දෙස බැලීමේදී පෙනී යන්නේ ශරීර සුවතාවයෙන් යුතුව දීර්ඝ කාලයක් ජීවත්වීම සඳහා නගර නිර්මාණයේ දී සෞඛ්‍යාරක්ෂිත විධික්‍රම භාවිතා කර ඇති බවයි. පුරාතන ලංකාව තුළ විජයාවතරණයට පෙර මෙන්ම ඊට පසු කාලයේදීත් සැලකිය යුතු වෛද්‍ය ප්‍රතිපත්තියක් තිබෙන්නට ඇතැයි අනුමාන කළ හැකිය. ක්‍රි.පූ. 6 වන සියවසේ දී විජයාවතරණයක් සමඟ විටින්විට පැමිණි ජන කණ්ඩායම් මගින් ඉන්දියාවේ තිබූ වෛද්‍ය ශාස්ත්‍රීය දැනුම ලංකාවේ සෞඛ්‍යාරක්ෂණ ක්‍රම අතරට මුසු වන්නට ඇත. කෙසේ නමුදු විජයාවතරණයට පෙර මෙන්ම ඊට පසු මහින්දාගමනය දක්වා වූ කාල පරාසය තුළ තිබූ සෞඛ්‍යාරක්ෂණ ක්‍රම පද්ධතිය මහින්දාගමනයත් සමඟ වෛද්‍ය ශාස්ත්‍රීය ඥානය පුළුල් වී සංවිධානාත්මක ලෙස හැඩ ගැසුණි. මනුෂ්‍යාට පමණක් නොව තිරිසන් සත්ත්වයාට හා ගහකොළ ආදියට ලෙඩරෝග හට ගැනීම සාමාන්‍ය දෙයකි.කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රයේ ඉන්දියාවේ නගර සෞඛ්‍යාරක්ෂිතව පවත්වාගෙන යාම සඳහා අනුගමනය කළ යුතු නීතිරීති පද්ධතියක් දක්වා තිබේ. වීදියක කුණු කසල දැමීම, වීදියක කසල හෝ ජලය රැඳෙන්නට ඉඩ හැරීම, සොහොන් බිම්වලින් පිට වෙනත් ස්ථානයක් මළ සිරුරු ආදාහනය කිරීම සතුන්ගේ මළ සිරුරු වීදිවල දැමීම යනාදී වැරදි ක්‍රියා සඳහා දඩ අය කළ යුතු බව සහ බෙහෙත් ගන්නා වූ, රෝගී වූ හා බිය නිසා මල මූත්‍රා හා කරන අයට දඬුවම් නොදිය යුතු බව සඳහන්ය . කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රයේ සඳහන් නාගරික පවිත්‍රතා සංකල්පය අප රට තුළ තිබූ බව පණ්ඩුකාභය රාජ්‍ය කාලයෙන් තහවුරු වේ.මෙවැනි සෞඛ්‍යාරක්ෂණ ක්‍රම පද්ධතියක් අනුගමනය කරන්නට හේතු සාධක වූ ලෙඩරෝග හා උපද්‍රව පිළිබද සහ රෝග නිවාරණ විධික්‍රම පිළිබද අධ්‍යයනය කිරීම මෙම ලිපියේ අරමුණ වේ.***

**හැඳින්වීම**

ප්‍රාග් ඓතිහාසික යුගයේ දී මානවයා තමන්ට වැළඳුණ රෝගාබාධ සඳහා සෞඛ්‍යාරක්ෂණ ක්‍රම පරිසරය තුළින්ම සපුරා ගන්නට ඇත. ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් රාවණා ඇල්ල, කෑගල්ල, අලුලෙන, බෙල්ලන්බැඳි පැලැස්ස, පාහියංගල යන ස්ථානවල කරන ලද කැණීම්වලදී ඇටකටුවලින් සාදන ලද සිදුරු විදින උපකරණ හා ආධාරකයට සවිකර භාවිතා කළ හැකි උපකරණ හමු වී ඇති අතර වනාන්තර ආශ්‍රිතව ජිවත් වූ මොවුන් ඇතැම් විට මෙම උපකරණ ආයුධ වශයෙන් මෙන්ම ඇතැම් අවස්ථාවලදී ශල්‍ය උපකරණ ලෙසද භාවිතා කරන්නට ඇතැයි සිතිය හැකිය.

ලංකා ඉතිහාසය තුළ සුවිශේෂී සන්ධිස්ථානයක් වුයේ මෙරටට බුදු දහම ලැබීමයි. එවකට ඉන්දියාවේ පාලකයා වූ ධර්මාශෝක රජුගේ ධර්ම දූත ව්‍යාපාරයේ ප්‍රතිඵලයක් ශ්‍රී ලංකාවට බුදු දහම ලැබුණු අතර මෙනිසා පැවැති දේශපාලන තන්ත්‍රයට හා ආර්ථික, සාමාජීය, සංස්කෘතික අංශවල නව අංග එකතු වෙමින් ක්‍රමවත් හා සංවිධානාත්මක සමාජ රටාවක් බිහිවිය. ධර්මාශෝක රජුගේ ප්‍රතිපත්තිය වුයේ මානව හිතවාදි දෘෂ්ටියක් තුළින් ජනහිතකාමී පාලන තන්ත්‍රයක් ඇති කිරිමයි. මෙනිසා රජු සමාජ සහ අධ්‍යාත්මික ශෝධකයකු සේ ක්‍රියා කරමින් මනුෂ්‍ය චිකිත්සාව මෙන්ම සත්ත්ව චිකිස්සාව කෙරෙහි ද අවධානය යොමු කරමින් මිනිසුන්ට සහ තිරිසන් සත්ත්වයින්ට අවශ්‍ය ඖෂධ තැන් තැන්වල පිහිට වූ බව සඳහන් වේ . ධර්මාශෝක රජුගේ ධර්මදූත ප්‍රචාරක කාර්යය නිසා ලංකාවේ තිබූ සෞඛ්‍යාරක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රමවත් හැඩ ගැසීමකට භාජනය වූ අතර මෙරට ජනතාවට වෛද්‍ය පහසුකම් සපයා දීමට බොහෝ රජවරු උනන්දුවකින් හා කැපවීමකින් යුතුව කටයුතු කර ඇති බවට සාධක හමු වේ.

**පුරාතන සමාජයේ පැවැති ලෙඩ රෝග**

පුරාතන සමාජයේ පැවැති ලෙඩරෝග සහ උපද්‍රව රාශියක් පිළිබඳ තොරතුරු රාශියක් මුලාශ්‍රයවල සඳහන් වේ. වා, පිත්, සෙම්රෝග, කණ්ඩු (කැසීම), ගර්භණී රෝග, අක්ෂි රෝග උදරාබාධ (ප්ලෝදර), කුෂ්ඨ, උණ, අපස්මාරය , දද, ගෙඩි, ගණ්ඩි (ගණ්ඩමාලාව), ක්ෂය රෝගය (රාජයක්ෂමා), බුජ්ජිය (කුදු බව), ගොළු බව (මූකත්ව), තඩිස්සිය (සුනිය), කොර බව (පීඨසප්පි), බරවා රෝගය (සිලීවය), දියවැඩියාව (මධුමේහය), වියළීම (ශෝෂ), නහර රෝග, පාණ්ඩු රෝග, මානසික රෝග යනාදී රෝග රාශියක් සඳහන් වේ . (පඤ්ඤාකිත්ති හිමි, 2003)එමෙන්ම සර්පයින් දෂ්ට කිරීම, විෂ මිශ්‍ර දියර වගී පෙවීම විෂ යෙදු ආයුධවලින් සිදුවන උපද්‍රව ද තිබී ඇත. ක්‍රි.ව. 340-368 අතර කාලයේ රජ පත් වූ බුද්ධදාස රජතුමා වෛද්‍ය සේවාව වෙනුවෙන් විශිෂ්ඨ කාර්යභාරයක් ඉටු කළ වෛද්‍යයරයකු වූ අතර

**ISBN 978-955-4563-72-8**

කායික හා මානසික එමෙන්ම පශු වෛද්‍ය ක්‍රමය ද මැනවින් ප්‍රගුණ කළ අයෙකි. දිළින්දන්ට වස්තු දීමෙන් ද, සුවපත් වූවන්ට භෝග ජීවිත රක්ෂයෙන් ද සිත් සතුටු කළ අතර, සත්පුරුෂයන්ට සංග්‍රහයෙන් ද, අසත්පුරුෂයන්ට නිග්‍රහයෙන් ද ගිලනුන්ට වෙදකමින් ද සංග්‍රහ කළ බව සඳහන්ය .( මහාවංසො , 1959)

*වාතාබාධෙන එකෝපි භික්ඛු උට්ඨාපිතො අහු ගොපානසිගතෙ තම්හි, දුක්ඛා මොචෙසි බුද්ධිමා*

යනුවෙන් අන් අයගේ පිළිසරණක් නැතිව වාතරෝගයෙන් අසරණව සිටි භික්ෂුවකට ප්‍රතිකාර කොට සුව කිරීමේ පුවතක් මහාවංසයේ සඳහන්ය . (මහාවංසො , 1959)එමෙන්ම කුස වැටී ගමෙහි පිඬු සිඟා වැඩි භික්ෂුවක් පණුවන් සමඟ ආහාර වැළඳීමෙන් හටගත් බඩේ රුදාවක් සුවපත් කිරීම,( මහාවංසො , 1959) දිය බිමෙදී දිය බරණ බිජුවක් ගිලුණු මිනිසෙකුට කළ ප්‍රතිකර්මයක් ,(මහාවංසො , 1959) පොල්ලොලිය නම් ගමේ සත්වරක් මූඪගර්භ (ගබ්සා) වු සැඩොලියක් සහ දරු ගැබක් සුවපත් කිරීම ,(බුද්ධදත්ත හිමි, 1959) කුෂ්ට රෝගියෙකුට ප්‍රතිකාර කිරීම සඳහන් වේ. (මහාවංසො , 1959) ඇතැම් සිද්ධි තුළ ආශ්චාර්ය බව ගැබ් වී තිබුණත් බුද්ධදාස රජු සතුව යම් වෛද්‍ය කුසලතාවයක් තිබුණ බව උපකල්පනය කළ හැකිය.

ජ්වර හෙවත් උණ රෝගය පිළිබඳ වංශකතාවල සඳහන් වේ. මිහිඳු මා හිමියන් මහා විහාරය පුජාවේදී දේවානම්පියතිස්ස රජුට කකුසඳ බුදුන්ගේ කාලයේ දී ලංකාද්වීපය දරුණු උණ වසංගතයකින් විපතට පත් සිදුවීමක් විස්තර කර ඇත. දේශගුණික විපර්යාසය හමුවේ අව්වැසිවලින් පීඩා විඳි ජනතාව නිරන්තරයෙන් උණ රෝගයට හා ඒ ආශ්‍රිතව වැළඳෙන සෙම්ප්‍රතිශ්‍යාව වැනි රෝගී තත්වයන්ට මුහුණ දෙන්නට ඇත. තුන්වන මුගලන් රජු දවස ඔහුගේ හමුදා සේනාවේ බොහෝ පිරිසක් උණ රෝගය වැළඳීමෙන් මිය ගිය නිසා මලය දේශයට පසු බසින්නට සිදු විය . (මහාවංසො , 1959)ජලාශ්‍රිත ශිෂ්ටාචාරයකට උරුමකම් තිබු මෙරට ජනතාවට මැසි මදුරු උවදුරු මගින් බෝ වන රෝගයට එදිනෙදා මුහුණ දීමට සිදු විම ස්වභාවිකය. ඇතැම් අවස්ථාවලදී මෙම උණ රෝගය වසංගතයක් ආකාරයෙන් ව්‍යාප්ත වන්නට ද ඇත. මහායාන ග්‍රන්ථවල , ජ්වර නැතිනම් උණ රෝගය පිළිබඳ නොයෙක් තැන්වල සඳහන් වේ. එක් දිනක් පවතින ජ්වර, දින දෙකක් පවතින, තෙදිනක්, සිව් දිනක්, සත් දිනක් පවතින මාසයක් හා සන්නිපාතික විෂම ජ්වර යනාදී වශයෙන් සඳහන් වේ . (පඤ්ඤාකිත්ති හිමි, 2003)

උපසග්ග හෙවත් වසංගත රෝග තිබූ බවට සාදක මූලාශ්‍රයවලින් තහවුරු වේ. IV වන කාශ්‍යප රජු උපසග්ග හෙවත් වසංගත රෝගයට ප්‍රතිකාර කිරිම සඳහා අනුරාධපුරයේ සහ පොළොන්නරුවේ රෝහල් පිහිටූ වූ බව

අනුරාධ පුරෙබෙච පුළත්ථිනගරේ පිච

උපසග්ග රෝග නාසාය වෙජ්ජසාලාපිකාරයි

යනුවෙන් මහාවංසයේ සඳහන් වේ .(*මහාවංසො* , 1959)V වන කාශ්‍යප රජු පාණ්ඩ්‍ය රජුගේ උපකාරය සඳහා යැවූ යුද්ධ හමුදා සේනාවට උපසග්ග රෝගය වැළඳී ඇති අතර පාණ්ඩ්‍ය රජු ද එම රෝගයෙන් මිය ගිය නිසා සිංහල සේනාව ආපසු ගෙන්වා ගැනීමට සිදු වූ පුවතක් ගැන සඳහන් වේ . (මහාවංසො , 1959)සිරිසඟබෝ රජු දවස ඇති වූ ඇස් රෝගයක් පිළිබඳව සඳහන් වන අතර එයට අවශ්‍ය ප්‍රතිකාර නොලැබීම නිසා බොහෝ ජනයා මිය ගොස් ඇත .මහා පරාක්‍රමබාහු රජතුමාගේ යුද්ධ කටයුතුවලදී පෙරමුණ ගත් රක්ඛ නම් සෙනෙවියා අතීසාර රෝගය වැළඳීමෙන් මියගිය බව සඳහන් වේ. (*මහාවංසො,* 1959) විශාල පිරිසක් අතර සීඝ්‍රයෙන් පැතිරී ගිය මෙම රෝගය අතිශයින් මරාන්තික වු බව පෙනේ .

දෙවන රාජසිංහ රජු දවස සිරකරුවෙකු බවට පත් වූ ඉංග්‍රිසි ජාතික රොබට් නොක්ස් රටේ සුලභව දක්නට ලැබෙන රෝග දෙකක් පිළිබඳව සඳහන් කරයි. එනම් ගැහෙන උණ හා ලේ මදකමින් හට ගන්නා රෝගය යි . මීට අමතරව නොක්සගේ වාර්තාවෙන් උගුර අමාරුවට ඇස් අමාරුවට තිබු බව සාදක ලැබේ . (knox,1981) රජරට රාජධානිය බිඳවැටී නිරිත දිගට සංක්‍රමණය විමේදී උතුර ප්‍රදේශ වල් බිහි වු අතර නොයෙකුත් රෝගකාරී තත්ත්වයන් ද හටගත් බව කිව හැකිය. විශේෂයෙන්ම ජලාශ්‍රිත ශිෂ්ටාචාරයක පරිහානිය සිදු වෙද්දි ඒ ප්‍රදේශ ආශ්‍රිතව මැසි මදුරු උවදුරු සීඝ්‍රයෙන් ව්‍යාප්ත වීමත් සමඟ උණ රෝගය හා ආශ්‍රිත වෙනත් රෝග වර්ධනය වන්නට ඇත. නිරිත දිග රාජධානි සමයේ ව්‍යාප්තව තිබු රෝග හෝ රෝහල් පිළිබඳ තොරතුරු සපයන සාහිත්‍ය හා පුරා විද්‍යාත්මක මූලාශ්‍රය බොහෝ විරල ය. අනුරාධපුර පොළොන්නරු රාජධානි සමයේ ජනතාව අතර පැතිරී ගිය

*ISBN 978-955-4563-72-8*

රෝග දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොල, මහනුවර පවතින්නට ඇතැයි සිතීම යුක්ති සහතිගතය.

**රෝග නිවාරණ ක්‍රම**

පුරාණ ලංකාවේ රෝග නිවාරණ විධික්‍රම ලෙස බෙහෙත් පෙවීම, නස්න කිරීම, තෙල් ගෑම, තෙල් බීමට දීම විරේකය, බෙහෙත් ඔරුවල බහා තැබීම, ගිනිහල් ගේ ප්‍රතිකාර සැත්කම් ආදී වූ ප්‍රතිකාර විධි තිබූ බවට සාධක හමු වේ. අග්නි පුරාණයේ රෝග රැසකට නිවාරණ විධික්‍රම දක්වා තිබේ . (පඤ්ඤාකිත්ති හිමි, 2003 ) භික්ෂූන්වහන්සේලාට බොහෝවිට උක් හකුරු, මිශ්‍ර කැඳ, ගිතෙල් බෙහෙත් කැඳ පූජා කොට ඇත. (*සද්ධර්මාලංකාරය*, 1997)බෙහෙත් කැඳ ලංකාවේ වැවුණු ඖෂධීය පැළෑටි වර්ග වලින් සදා ගන්නට ඇත. මෙයට අමරතව තෙල් වගී ගෑම, තෙල් ආලේප කිරීම තෙල් බීමට දීම, කල්ක රෝග නිවාරණය සඳහා භාවිතා කර ඇති බව තහවුරු වේ .(*පූජාවලිය* ,2007) ඇතැම් දහම් කරුණු අවබෝධ කිරීම සඳහා උපමාවට ගෙන ඇත්තේ වෛද්‍ය ක්ෂේත්‍රය හා බැඳුණු සිද්ධාන්ත බව පෙනේ.

*"ප්‍රාණ ඇත්තවුන්ට තියඹරා කන්නට කියන්නා සේ, සෙම් ඇත්තවුන්ට උක් සකුරු කන්නට කියන්නා සේ, මේහ ඇත්තවුන්ට තෙල් අනුභව කරන්නට කියන්නාසේ, වණ ඇත්තවුන්ට මීවිනි මස් අනුභව කරන්නට කියන්නා සේ ..................................* " යනුවෙන් සඳහන් වේ . (*සද්ධර්මරත්නාවලිය*, 2005) මෙයින් ප්‍රත්‍යක්ෂ වන්නේ ඉහත රෝගවලට තියඹරා, උක් සකුරු, තෙල් අගුණ බවයි.

යහපත් දින චර්යාවක් අනුගමනය කිරීම ලෙඩ රෝගවලට පිළියමක් බව මූලාශ්‍රයවල දක්වා තිබේ. භික්ෂූන් වහන්සේලා උදෑසන සක්මන් කළ යුතු බව පොළොන්නරුවේ ගල් විහාර ලිපියේ සඳහන් වේ (*EpigraphiaZeylanica*, vol II, 1928) දඹදෙණි කතිකාවතෙන් පුරාණ ලංකාවේ වෛද්‍ය ශාස්ත්‍රය පිළිබඳ තොරතුරු සඳහන් වන අතර රෝග පීඩා ආදියෙන් සුවය ලැබීම සඳහා බිලි පූජා, ශාන්ති කර්ම, යක් නැටුම් ආදිය සිදු නොකළ යුතු බව දක්වා ඇත . (ජයතිලක, 2004)

*"උපන් රෝගය නිසා යකුන් කෙළවීම, බලි තිබීම්, බලිබත් කියවීම් ආදී නොසරුප් දෑ නොකටයුතුය "*

ගිහි සමාජයේ පැවැති යකුන් එළවීම, බලි තොවිල් ආදිය කෙරෙහි භික්ෂූන් වහන්සේලා නැඹුරුව කටයුතු කළ බව මෙතුලින් තහවුරු වේ. මෙයින් පැහැදිලි වන්නේ අතීතියේ ලෙඩරෝග නිවාරණය ක්‍රමයක් ලෙස ගුප්ත ප්‍රතිකාර විධිවලට නැඹුරුවක් දක්වා තිබෙන බවයි.

රෝග නිවාරණය කළ විධික්‍රමයක් වූයේ සැත්කමය. බුද්ධදාස රජතුමා ශල්‍ය වෛද්‍යවරයෙක් වශයෙන් ප්‍රසිද්ධියක් ඉසිලීය. ඔහු විසින් සිදු කරන ලද සැත්කම් පිළිබඳව මහාවංසයේ සඳහන් වේ. සැත්කමක් සිදු කිරීමට යහපත් මානසිකත්වයක් අවශ්‍යය. ඒ බව විශුද්ධි මග්ගයේ යම් යම් දහම් කරුණු අවබෝධ කිරීම සඳහා සැත්කම් විධික්‍රම නිදර්ශනයට ගෙන තිබීමෙන් තහවුරු වේ. භාවනාවේ දී මනස ඒකාග්‍රතාවයෙන් රඳවා ගත යුතු ආකාරය උපමා කර ඇත්තේ සැත්කම් විධික්‍රමයටය. විසුද්ධි මග්ගයෙහි (*විශුද්ධි මාගීය*, 2008)***"පැන් තළියෙහි තිබූ මහනෙල් මල් පෙත්තෙහි ශිරා වේධා දී ශාස්ත්‍ර කර්ම උගන්නා ශල්‍ය වෛද්‍ය ශිෂ්‍යයන් අතුරෙන් ඉතා දක්ෂ තැනැත්තේ ශිස්‍රව ශාස්ත්‍රය හෙළලීමෙන් මහනෙල් පෙත්ත දෙකඩ කොට හෝ පලා ලන්නේය. දියෙහි හෝ ගලා ලන්නේ ය. අදක්ෂ තැනැත්තේ පෙත්ත කැපීයේ දෝ දියෙහි ගැලී යෙදෝ යන බියෙන් සැතින් ස්පර්ශ කරන්නට අපොහොසත් වන්නේය. අති දක්ෂත් නොවූ අදක්ෂත් නොවූ සම දක්ෂ ශිෂ්‍ය වනාහි සම ප්‍රයෝගයෙන් පෙත්තෙහි සැත් පද දක්වා ශිල්ප පුහුණු කොටැ ගෙනැ එබඳු ශාස්ත්‍ර කර්මයෙහි වැඩ කොටැ ලාභ ලබන්නේය ..."*** යනුවෙන් සඳහන් වීමෙන් පෙනී යන්නේ සැත්කම් සිදු කිරීම සඳහා හොඳ පුහුණුවක් හා යහපත් මානසිකත්වයක් අවශ්‍යයි බවයි.

පුරාණ රෝහල් ආශ්‍රිතව සිදු කරන ලද කැණීම්වල දී සැත්කම් සඳහා භාවිතා කළා යැයි අනුමාන කළ හැකි ශල්‍ය උපකරණ හමු වී තිබේ. මෙතුලින් පැහැදිලි වන්නේ පුරාන ලංකාව තුල දියුණු වෛද්‍ය ශාස්ත්‍රීය දැනුමක් තිබූ බවයි.

විසෝපසමනය හෙවත් විෂ කැවූ ආයුධවලින් සිදුවන තුවාල සුව කිරීම සඳහා ප්‍රතිකාර විධික්‍රම අනුගමනය කළ බවට සාධක පළමුවන පරාක්‍රමබාහු රාජ සමය තුලින් ලැබේ.මේ රජු තම යුධ ව්‍යාපාරයේ දී විෂ පෙවූ අවිවලින් සිදුවන උපද්‍රව සුව කිරීම සඳහා සියුම් බෙහෙත් වර්ග ගව අං කුප්පුල තුළ අසුරා තිබීම, ශරීරය තුළට ගැඹුරුට ඇණුන විෂ පෙවූ ඊතල ඉවත් කරන ලෝහ අඬු කතුරු ආදී ශල්‍ය උපකරණ ද ශරීරය විෂ පෙවූ ඊතළ අවිවලින් ආරක්ෂා කරන මී හරක් සමින් කළ

*ISBN 978-955-4563-72-8*

සන්නහ, සතුරන් විෂ යෙදූ වැව් ළිං ජලාශවල දිය විර්විෂ කොට පවිත්‍ර කරන ඖෂධ වර්ග භාවිතා කොට ඇති බව මහවංසය තුළින් තහවුරු වේ .(*මහාවංසො* , 1959)

ප්‍රතිකාර විධි ක්‍රමයක් ලෙස බෙහෙත් ඔරු භාවිතය ද දැක්විය හැකිය. මෙම බෙහෙත් ඔරු මිනිසෙකු උඩුකුරුව පහසුවෙන් දිගා වී සිටිය හැකි පරිදි නිවැරදි ශරීර හැඩයට අනුව සකස් කොට ඇත. බෙහෙත් ඔරු බොහෝවිට දක්නට ලැබෙන්නේ රෝහල් ආශ්‍රිතව වන අතර අනුරාධපුර, ථූපාරාමය අසල මිහින්තලේ, මැදිරිගිරිය, පොළොන්නරු ආදාහන පිරිවෙන රෝහල් සංකීර්ණ තුලින් බෙහෙත් ඔරු දැකගත හැකිය. මෙතුලට බෙහෙත් තෙල් හෝ බෙහෙත් පැළෑටිවල යුෂ ජලය හා මිශ්‍ර කොට පුරවා රෝගීන්ට වැතිර සිටීමට සලස්වන්නට ඇත.

මහාචාර්ය අනුරාධපුර සෙනෙවිරත්න මහතා සඳහන් කරන්නේ මෙම බෙහෙත් ඔරු වාත රෝග වැනි ව්‍යාධීන්ගෙන් පෙළන රෝගීන්ට ප්‍රතිකාර සඳහා යොදා ගත්තා විය හැකි බවයි .(සෙනෙවිරත්න,2002.) රෝග නිවාරණ ක්‍රම අතර ජන්තාඝර හෙවත් ගිනිහල් ගෙය භාවිතා කොට ඇත. භික්ෂූන්ගේ ආරාම ගොඩනැගලි ආශ්‍රිතව ජන්තාඝර ඉදි කර තිබූ බවට සාධක අනුරාධපුරය, පොළොන්නරුව, රිටිගල යන ස්ථානවලින් ලැබේ. භාවනායෝගී භික්ෂූන් වහන්සේලා වැඩ සිටි රිටිගල, වැනි ස්ථානවලින් ස්නානය සඳහා ඖෂධ වර්ග පිළියෙල කරගත් ඇඹරුම්හල් හා උණු ජලය ස්නානය සඳහා යොදා ගත් ජන්තාඝර හමු වී තිබේ. සාමාන්‍ය ජනතාව අතර ද ඖෂධ කොට යුෂ ගෙන ස්නානය කිරීමේ පිළිවෙත් තිබෙන්නට ඇත. දහඩිය දැමීමට සලස්වා රෝග දෝෂ සිරුරෙන් ඉවත් කිරීමේ ක්‍රමවේදයක් ද තිබී ඇත. රත්කළ ඖෂධ වර්ග අතුරා ඒ මත රෝගියා තැන්පත් කිරීම, උණු කරනු ලබන ඖෂධ දියෙහි හුමාලය නළයක් මගින් ආබාධිත ස්ථානයට වැද්දවීම, බෙහෙත් ද්‍රව්‍ය පොට්ටනිවල බහා රත් කර රෝගියා තැවීම, රත්කළ ජලයේ හුමාලය වැද්දවීමට සැලැස්වීම මගින් දහඩිය පිට කර රෝග දෝෂ සිරුරෙන් බැහැර කළ හැකි ස්වේද විධි කිහිපයක් පිළිබඳ සඳහන් වේ .(අනුමෝදනා 361 පිටුව)උඩරට සමාජය තුළ තිබූ රෝග නිවාරණ ක්‍රම පිළිබඳ පැහැදිලි අදහසක් රොබට් නොක්ස්ගේ වාර්තාව තුළින් ලබා ගත හැකිය. වමනය කරවීමට, වමනය සමනය කිරීමට විරේකයට, තුවාලවලට හා ඇස් රුදාව ආදී වූ රෝග සඳහා භාවිතා කළ බෙහෙත් වර්ග දක්වා තිබේ . (knox, 1981) රෝග නිවාරණ මාධ්‍යයක් ලෙස වෙදහල් හෙවත් රෝහල ප්‍රධාන තැනක් ගනියි. විවිධාකාරයේ රෝහල් පැවැති බව අනුරාධපුරය, මිහින්තලේ, මැදිරිගිරිය, පොළොන්නරුව ආළහණ පිරිවෙන් සංකීර්ණය දීඝවාපිය යනා දී ස්ථානවලින් තහවුරු වේ. මූලාශ්‍රයගත තොරතුරුවලට අනුව රෝහල් මෙසේ වර්ගීකරණය කළ හැකිය.

01. ආරාම ආශ්‍රිතව පැවැති භික්ෂු නේවාසික රෝහල්

02. ගිහි නේවාසික රෝහල්

03. බාහිර රෝගීන් සඳහා වූ රෝහල්

04. සූතිකාගාර

ආරාම ආශ්‍රිතව භික්ෂු නේවාසික රෝහල් පැවැති බවට සාධක අනුරාධපුරයේ ථූපාරාමය, රුවන්වැලි සෑය, මිහින්තලේ, මැදිරිගිරිය, පොළොන්නරුව ආළහණ පිරිවෙන් සංකීර්ණය, දීඝවාපිය යන ස්ථානවලින් ලැබී ඇත. සෑම රෝහලක් ආශ්‍රිතවම බෙහෙත් ඔරුවක් දක්නට ලැබේ. බෙහෙත් සකස් කිරීම සඳහා යොදාගත් ඇඹරුම්ගල්, ශල්‍ය කර්ම සඳහා භාවිතා කළ උපකරණ, කතුරු, කැපුම් තල, බෙහෙත්, රූස්කර තැබීම සඳහා භාවිතා කළ චීන බඳුන් හමු වී තිබේ . ගිහි නේවාසික රෝහල් තිබූ බවට සාධක හමු වේ. දුටුගැමුණු රජතුමා (ක්‍රි.පූ. 161 - 137) මරණාසන්න අවස්ථාවේ දී තමා කළ උසස්ම සේවාවන් අතර, මහජනයා වෙනුවෙන් සැපයූ වෛද්‍ය පහසුකම් සිහිපත් කළ බව සඳහන් වේ . (*මහාවංසො,* 1959)

නිච්චං අට්ඨාරසට්ඨානෙ, වජ්ජෙහි විහිතං අහං

ගිලාන භත්ත භෙසජ්ජං, ගිලානානමදාපයිං

යනුවෙන් ස්ථාන දහ අටක වෛද්‍යවරුන් විසින් නියම කරන ලද, ගිලන් බත් හා බෙහෙත් රෝගීන්ට දුන් බව සඳහන් වීමෙන් තහවුරු වන්නේ මෙම ස්ථානවල ගිහියන් සඳහා ද ඉඩකඩක් වෙන් වී තිබෙන්නට ඇති බවයි. ලංකාවේ වෛද්‍ය ශාස්ත්‍රය සම්බන්ධයෙන් ප්‍රසිද්ධියක් ඉසිලූ බුද්ධදාස රජතුමා ගම් දහයකට එක් වෛද්‍යවරයකු පත් කළ අතර, ඔවුන්ගේ වැටුප් සඳහා කෙත් වත් ආදායමින් විස්සෙන් අඩක් දෙනු ලැබීය . (*මහාවංසො,* 1959 ) කොරභාවයට පත් පුද්ගලයන්ගෙන්

***ISBN 978-955-4563-72-8***

සහ අන්ධ අයගේ ප්‍රයෝජනය සඳහා ශාලා ඉදි කළ අතර රජු ප්‍රදේශ සංචාරයේ දී හමුවන රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා සැත් මිටිය හා බෙහෙත් ඉණ තබාගෙන සිට ඇත . පළමු වන උපතිස්ස රජතුමා අංගවිකල රෝගීන් සඳහා රෝහල් පිහිටුවා තිබේ . ක්‍රි.ව. 406 - 428 අතර කාලයේ රජකළ මහානාම රජු ගිලන්හල් පිහිටුවා තිබේ . ධාතුසේන රජතුමා රෝගීන්ට ප්‍රතිකාර ගැනීම සඳහා ශාලා , සෑදූ වු අතර දෙවන දප්පුල රජු පොළොන්නරුවේ වෛද්‍ය ශාලාවක් කරවා අන්ධ හා කොර පුද්ගලයන්ට ප්‍රතිකාර ගැනීම සඳහා වෙද ශාලාවක් පිහිටුවීය . (*මහාවංසො,* 1959 )IV වන කාශ්‍යප රජුගේ සේන නම් වු සෙන්පතියා අනුරාධපුරයේ හා පොළොන්නරුවේ උවදුරු රෝග නැති කිරීම සඳහා රෝහල් පිහිට වූ බව සඳහන් ය.(*මහාවංසො,* 1959 ) පොළොන්නරුවේ සිටි පළමු වන පරාක්‍රමබාහු රජතුමා නොයෙකුත් රෝගීන්ගේ වාසයට සුදුසු වු වෛද්‍යශාලාවක් කරවා සියලු රෝගීන්ට දිව රාත්‍රී දෙකෙහි ගත යුතු බෙහෙත්, කැඳ හා ආහාර පාන සපයනු සඳහා එක් පුද්ගලයෙක් පත් කර ඇත .(*මහාවංසො,* 1959 ) මෙම සාධකවලින් තහවුරු වන්නේ සෑම රජකෙනෙක්ම මහජන සුභ සිද්ධිය මූලික කොට ගෙන රෝහල් පිහිටුවා තිබෙන බවයි.

**නිගමනය**

මේ අනුව පැහැදිලි වන්නේ රාජ්‍යත්වයට පත් සෑම පාලකයෙක් ම ජනතාවගේ සෞඛ්‍යය තත්ත්වය නංවාලීම උදෙසා කටයුතු කර ඇති බවත් බොහෝ ලෙඩ රෝග විශාල පිරිසක් අතර සීග්‍රයෙන් පැතිරී ගොස් වසංගත තත්ත්වයකට පත් වු බවත් ය. එමෙන් ම පුරාතන ලංකාවේ ලෙඩ රෝග බහුල වශයෙන් පැවති අතර රෝග නිවාරණය සඳහා විවිධ ක්‍රමවේද භාවිත කොට ඇති බවත්, බොහෝවිට ඖෂධ වර්ග පරිසරයේ ඇති ගස්කොළ, වැල්, පොතු, වලින් ලබා ගන්නට ඇතැයි නිගමනය කළ හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

*උර්ණපූර්ණ සහිතො මහාවංසො* 1959, (සංස්)බුද්ධදත්තහිමි, පොල්වත්තේ. කොළඹ, ඇම්.ඩී. ගුණසේන සමාගම.
*සද්ධර්මාලංකාරය*(1997)දෙහිවල,(සංස්)බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
*සද්ධර්මරත්නාවලිය*(2005) (සංස්) ඤාණවිමල, කිරි ඇල්ලේ.කොළඹ, ඇම්.ඩී. ගුණසේන සමාගම.
*පූජාවලිය*,(2007)දෙහිවල, (සංස්),බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
*විශුද්ධි මාර්ගය*(2008) දෙහිවල, (සංස්) බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
*කතිකාවත් සඟරා*(2004)කොළඹ. (සංස්) ජයතිලක, ඩී.බී. රත්න පොත් ප්‍රකාශකයෝ.
*කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය,* 2003,(අනු:) පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ. කොළඹ, ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.
පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ (2003)*මහාචාර්ය හග්වන්රාම් ගුප්තගේ ආයුර්වේදයේ ප්‍රාමාණික ඉතිහාසය*,කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ .
සරණංකර හිමි, ගණේගම, (1963), *බෞද්ධ මහාධිරාජ අසෝක හා සෙල්ලිපි*,මරදාන,මංගල මුද්‍රණාලය.
සෙනෙවිරත්න, අනුරාධ (2002)*පුරාණ අනුරාධපුරය*, කොළඹ,ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ,
සිරිවීර, ඉන්ද්‍රකීර්ති, (2004) *"පුරාතන ලංකාවේ සෞඛ්‍යය සහ ස්වස්ථතාව "අනුමෝදනා*,කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
*An historical relation of Ceylon*, (1981), Dehiwala, knox, Robert,Tisara Prakasakayo Ltd.
*Eigraphia Zeylanica,* vol II, (1928) London,Wickremasinghe D.M. De Silva, oxford University Press.